# 20. ජෝශප්

ඊසාක්ගේ පුත් ජාකොබ්ට දරුවන් දොළොස් දෙනෙක් සිටියා. ජාකොබ් අනෙක් දරුවන්ට වඩා ජෝශප්ට ආදරෙයි. දවසක් අලංකාර කබායක් සාදවා ජෝශප්ට තෑගි කළා. මේ නිසා අනෙක් සහෝදරයෝ ජෝශප්ට ඊර්ෂ්‍යා කළා.

ජෝශප්ගේ සහෝදරයෝ දිනක් ඔවුන්ගේ බැටළුවන් තණ කැවීම පිණිස ඈත ප්‍රදේශයකට අරගෙන ගියා. දවසක ජාකොබ් සහෝදරයන්ගේ සුවදුක් බලාගෙන එන ලෙසට ජෝශප් පිටත් කර යැවුවා.



තමන් වෙත එන ජෝශප් දුටු සහෝදරයෝ ඔහු මරා දැමීමට සිතුවා. පසුව එම තීරණය වෙනස් කර මිසරයේ සිට පැමිණි වෙළෙන්දන්ට ජෝශප්ව විකුණුවා.

මිසරයට ගිය වෙළෙන්දෝ ජෝශප් පොතිපාර් නැමති උසස් නිලධාරියකුට විකුණුවා. පොතිපාර් ජෝශප්ගේ සේවය ගැන සතුටු වුණා. නමුත් ඔහුගේ බිරිඳ ජෝශප්ට විරුද්ධව බොරු පැමිණිලි කර ඔහු සිරගෙට යැවුවා.

දෙවි පියා වෙනුවෙන් පැමිණෙන කරදර සියල්ල ම සතුටින් බාරගත් ජෝශප් සිර ගෙදර දී හොඳින් සිටියා. එහි දී සිරකරුවන් දෙදෙනෙකුගේ සිහින තේරා දුන්නා. එම සිහින පිළිබඳ ව ජෝශප් පැවසූ සියල්ල ඒ අයුරින් ම ඉටු වුණා.

මේ අතර මිසරයේ රජු ද භයානක සිහිනයක් දුටුවා. එය විසඳා දීමට කෙනෙකු සෙවුවා. සිරගෙදර සිටි ජෝශප් ගැන රජුට දැන ගන්නට ලැබුණා. ඔහු තමා වෙත ගෙන්වා තමාගේ සිහින තේරුම් කර දෙන ලෙස පැවසුවා.

'එම සිහිනයට අනුව මිසරයට සරුසාර අවුරුදු හතක් උදා වෙනවා.. ඉන්පසු අවුරුදු හතක් තුළ දරුණු නියඟයක් පවතිනවා. එබැවින් හැකි පමණ ආහාර ගබඩා කර තබා ගන්න' කියා ජෝශප් පැවසුවා.

මෙයින් පැහැදුණු රජු ජෝශප් භාණ්ඩාගාරයේ ප්‍රධාන ඇමතිකමට පත් කළා. ඔහු සරුසාරවත් අවුරුදු හත තුළ ආහාර විශාල ප්‍රමාණයක් ගබඩාවේ තැන්පත් කළා.

සිහිනය සැබෑ කරමින් නියඟය පටන් ගත්තා. ආහාර හිඟ වුණා. ජෝශප්ගෙන් ආහාර ලබා ගැනීමට වෙන රටවල සිට පවා සෙනඟ පැමිණියා. මේ අය අතර ජෝශප්ගේ සහෝදරයන් ද සිටියා. ඔවුන් ජෝශප් හඳුනා ගත්තේ නැතත් ජෝශප් ඔවුන් හඳුනා ගත්තා. ඔවුනට සමාව දුන්නා.

තම පියා වන ජාකොබ් තවමත් ජීවතුන් අතර සිටින බව සහෝදරයන්ගෙන් දැන ගත් ජෝශප් බොහෝ සතුටු වුණා. ජාකොබ් ද රැගෙන මිසරයට එන ලෙසට සහෝදරයන් පිටත් කර යැවුවා. පවුලේ සියල්ලන් ම මිසරයට පැමිණි විට ජෝශප් ඔවුන් සැමට ජීවත් වීමට හොඳ නිවාසයක් ලබා දුන්නා. සියලු දෙනා ම නැවත සමඟියෙන් සතුටින් ජීවත් වුණා.

**අපිත් ජෝශප් වාගේ දෙව් පියාට**
**ආදරේ කරමු. අන් අයට ආදරේ කරමු.**
**කොතරම් කරදර පැමිණියත්**
**අපි දෙව් පියා අමතක නොකරමු.**

### පැවරුම්

1. මෙම පාඩමේ අඩංගු වන ජෝශප්ගේ හොඳ ගුණාංග මොනවා දැයි ලියන්න
2. ජෝශප් මෙන් ඔබත් ඔබගේ සහෝදර සහෝදරියන්ට උදවු කරන්න.